# ටවර් හෝල් රඟහල පදනම

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ටවර් රඟහල පදනමේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ටවර් රඟහල පදනමේ ක්‍රියාකාරිත්වය පිළිබඳ පැවති තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම් ඉදිරිපත් කිරීම

විගණන පරීක්ෂණ වලදී හෙළිදරව් වූ රු.2,100,000 ක ගිණුම්වල අඩුවෙන් දැක්වීම් පෙන්වා දීමෙන් පසු අවසාන මූල්‍ය ප්‍රකාශන නිවැරදි කර විගණනයට ඉදිරිපත් කරන ලදී.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 අනුව මූල්‍ය ස්වරූපයේ නොවන රාජ්‍ය ප්‍රදාන ලැබීමේදී අදාළ ප්‍රදානය සංචිතයකට බැර කළයුතු අතර ලැබූ වත්කමේ ඵලදායී ජීවිත කාලය පුරා එහි ක්ෂය ප්‍රතිපත්තියට සමාන්තරව ප්‍රදාන සංචිතය වර්ෂයේ ලාභයට බැර කිරීම තුළින් වාර්ෂිකව ආදායමට හඳුනාගත යුතුය. නමුත් ටවර් රඟහල පදනම වෙත 2003 හා 2006 වර්ෂවලදී ලැබී තිබූ මුළු වටිනාකම රු.44,901,250 ක් වූ ශබ්දාගාර උපකරණ හා මෝටර් වාහන වල 2010 ජනවාරි 01 දින වනවිට ක්ෂය කර නිමවූ රු. 32,086,849 ක් එසේ ආදායමට හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2000 - 2008 කාල පරිච්ඡේදය තුළ ජීවන වියදම් දීමනාව අත්හැර සේවක අර්ථ සාධක හා සේවක භාරකාරත්ව දායක මුදල් ගණනය කිරීම නිසා ඉහත කාලපරිච්ඡේදයට අදාළ සේවා යෝජකයාගේ අර්ථ සාධක හා සේවක භාරකාරත්ව අරමුදලේ හිඟ දායක මුදල් ලෙස පිළිවෙලින් රු.2,514,476 ක් හා රු.502,895 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය රු.3,017,371 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ ) අපහරණය කරන ලද වත්කම් විකිණීමෙන වර්ෂය තුළදී රු.90,860 ක මුදලක් උපයාගෙන තිබූ නමුත් විකිණීමට අදාළ වත්කම් වල පිරිවැය හා ක්ෂය, වත්කම් අපහරණ ගිණුමට ගලපා නොතිබූ අතර එම ගැලපීම් වත්කම් හා ක්ෂය වෙන් කිරීම් ගිණුම් වලට ගලපා ගිණුම් යාවත්කාලීන කර නොතිබුණි.

1.2.3 <u>ලැබිය යුතු ගිණුම්</u>

(අ ) 2006 සිට 2008 දක්වා වූ කාලපරිච්ඡේදයට අදාළව රුක්මණී දේවී සමරු රඟහලේ දේශන පැවැත්වීම, වෙනුවෙන් බාහිර පාර්ශවයන්ගෙන් අයවිය යුතු රු.199,280 ක කුලී ගාස්තුව සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අයකර ගැනීමට ක්‍රියාකර නොතිබුණි.

(ආ) ලැබිය යුතු කාලීන තැන්පතු පොලී රු.926,247 ක, ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලී රු.758,773 ක් හා ලැබිය යුතු බස් කුලී රු.38,440 ක් සඳහා ශේෂ සනාථ කිරීම් විගණනයට ඉදිරිපත් නොවුණි.

1.2.4 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම</u>

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ ) | රජයේ මුදල් රෙගුලාසි 371 (2 ) හා 371 (2) (අ ) | (i ) | යම් නිශ්චිත කාර්යයක් සඳහා නිලධාරීන්ට ලබාදෙන අතුරු අග්‍රිම එම කාර්ය නිමවූ විගසම පියවිය යුතු වුවත්, නිලධාරීන් 5 දෙනෙකු එසේ ලබාගත් අත්තිකාරම් දින 26 සිට දින 150 දක්වා නොපියවා තිබූ බව නිරීක්ෂණය විය. |
| | | (ii) | 2010 පෙබරවාරි 22 දින සහ මාර්තු 03, 10 හා 16 යන දිනයන්හි අවස්ථා 22 කදී එකම නිලධාරියාට මු.රෙ. වලට පටහැනිව රු.20,000 උපරිම සීමාව ඉක්මවා අතුරු අග්‍රිම ලබාදී තිබූ අතර එසේ ලබා දුන් අත්තිකාරම් මුළු එකතුව රු.890,000 ක් විය. |
| (ආ) | මුදල් රෙගුලාසි 756 හා 757 | | පදනම විසින් 2010 වර්ෂය සඳහා භාණ්ඩසමීක්ෂණයක් සිදුකර නොතිබුණ. |

| | | |
|---|---|---|
| (ඇ ) | 2003 ජූනි 02 දිනැති අංක: PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3 ඡේදය | සමාලෝචිත වර්ෂය අවසානය තෙක් අනුමත සංවිධාන ව්‍යුහය සහ වැටුප් ක්‍රම පදනම් කරගෙන ආයතනයේ කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි සකස් කර අනුමත කර ගෙන නොතිබුණි. |
| (ඈ) | 2008 ජූනි 26 දිනැති අංක : 13/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 9 ඡේදය | ටවර් හෝල් රඟහල පදනමේ ගණකාධිකාරී හා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (රඟහල් ) යන තනතුරු වෙනුවෙන් මාසික ඉන්ධන දීමනාව වශයෙන් භාරකාර මණ්ඩල තීරණය මත රු.13,800 බැගින් ගෙවා තිබූ අතර ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ ටවර් රඟහල පදනමේ මූල්‍ය ප්‍රතිඵලය රු.8,455,736 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 2,421,609 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය ප්‍රතිඵලයේ රු.10,877,345 ක පිරිහීම සඳහා රජයෙන් ලැබුණු ප්‍රදානය රු.4,980,000 කින් අඩුවීම හා මෙහෙයුම් වියදම් රු.7,693,734 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

#### 2.1.2 මතභේදයට තුඩුදෙන කරුණු

2007 වසරේ ගුණාත්මක නාට්‍ය නිර්මාණය සඳහා මූල්‍යාධාර සැපයීම් යටතේ නාට්‍ය නිර්මාණ කරුවෙකුට නාට්‍යයක් නිෂ්පාදනය කිරීම සඳහා පදනම විසින් රු.194,000 ක මූල්‍යාධාරයක් ලබාදී තිබුණි. එම ගිවිසුම් කොන්දේසි අනුව නාට්‍ය දර්ශන වාර වලින් පදනමට අයවිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ආධාර ලෙස ලබාදුන් මුදල හා ඒ වෙනුවෙන් දරන ලද රු.29,530 ක අනෙකුත් වියදම් ද ඇතුළුව එකතුව රු.223,530 ක් නිසි අධිකාර් බලයකින් තොරව 2010 වර්ෂයේ වියදමට කපා හැර තිබුණි.

ඉහත මුදල ගිණුම් වලින් කපා හැරීම සඳහා මුදල් රෙගුලාසි 113 (3 ) පරිදි අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් පාලක මණඩලයද දැනුවත් කර නොතිබුණි.

2.2 **මෙහෙයුම් සමාලෝචනය**

2.2.1 **සැලසුම් කිරීම හා කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රතිපාදන කපා හැරීම මත ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ව්‍යාපෘති 11 ක් ක්‍රියාත්මක නොකරන බව 2010 සැප්තැම්බර් 07 දිනැති ප්‍රගති වාර්තාවේ දක්වා ඇතත්, ප්‍රතිපාදන සංශෝධනය සිදුවී තිබුණේද අගෝස්තු මාසයේ දී බැවින් එම ව්‍යාපෘති වල මුල් කාර්තු වලට අදාළ කටයුතු වල ප්‍රගතියක් පෙන්නුම් කළයුතුව තිබුණ ද එසේ නොවන අවස්ථා නිරීක්ෂණය විය.

(i) දෙවන කාර්තුව අවසන් වන විට නූර්ති ගී ප්‍රසංග 3 ක් පැවැත්වීමට හා නාට්‍ය 6 ක් ප්‍රදර්ශනය කිරීමට සැලසුම් කර තිබුණද එක් නූර්ති ගී ප්‍රසංගයක් පමණක් පවත්වා තිබුණු නමුත් එකදු නාට්‍යයක්වත් ප්‍රදර්ශනය කර නොතිබුණි.

(ii) නාට්‍ය හා රංග කලා පුස්තකාලය සංවර්ධනය සඳහා කබඩ් එකක් සහ පොත් 50 ක් මිළදී ගැනීමට දෙවන කාර්තුව සඳහා රු.150,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, ඒවා මිළදීගෙන නොතිබුණි.

(iii) නාට්‍ය හා රංග කලාව සම්බන්ධ ප්‍රදර්ශනයක් පළමුවන කාර්තුවේ පැවැත්වීමට සැලසම් කර තිබුණත් එය පවත්වා නොතිබුණි.

(ආ) ක්‍රියාකාර සැලැස්ම අනුව කලාකරුවන් සිහිපත් කිරීමේ නිර්මාණ ඇගයුම් උත්සව 10 ක් වෙනුවෙන් රු.500,000 ක් ප්‍රතිපාදන සලසා තිබුණත් 2010 අගෝස්තු දක්වා වූ මූල්‍ය කාර්ය සාධන වාර්තා අනුව උත්සව 2 සඳහා පමණක් රු.864,406 ක් වැය කර තිබුණි.

(ඇ) 2010 වර්ෂය තුළදී පදනමේ අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් ළඟා කරගත් භෞතික කාර්ය සාධනය ඇගයීම සඳහා ප්‍රමාණවත් තොරතුරු විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

2.2.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

(අ) 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි විධිවිධාන වලට අනුගත වන පර්දි ටවර් හෝල් රඟහල පදනමේ කාර්ය මණ්ඩලය ද වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ වලට අනුකූලව නව තනතුරු වලට හා නව වැටුප් ව්‍යුහයට අන්තර්ග්‍රහනය කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවද 2010 දෙසැම්බර් 31 දින වන විටත් ආයතනය විසින් එම කටයුතු සිදු කර නොතිබුණි.

(ආ) 2008 සහ 2009 වර්ෂ වලට අදාළ වාර්ෂික වාර්තා 2010 දෙසැම්බර් 31 වන විට පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

(ඇ ) 2008 සැප්තැම්බර් 01 දින සිට ටවර් රඟහල ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වසා දමා තිබූ අතර ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රමාදවීමේ හේතුවෙන් 2010 වර්ෂයට රු.1,488,000 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ රඟහලේ ආදායම ආයතනයට අහිමි වී තිබුණි.

2.2.3 <u>අරමුදල් ඌන උපයෝජනය</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ ) පදනම සතු ලංකා බැංකු ජංගම ගිණුමේ වසර පුරා රු.මිලියන 9 කට වැඩි ශේෂයක් පැවති අතර එම මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

(ආ) මීගමුව ලංකා බැංකු ජංගම ගිණුමේ රු. මිලියන 1 ක ශේෂයක් 2009 අගෝස්තු සිට 2010 දෙසැම්බර් 31 දක්වා අක්‍රියව පැවති බව නිරීක්ෂණය විය.

2.2.4 <u>නිෂ්ක්‍රීය වත්කම්</u>

2008 අප්‍රේල් 03 දිනැති අංක 223 දරන භාරකාර මණ්ඩල තීරණය අනුව 17 - 2560 දරන වාහනය අපහරණය කිරීම සඳහා තීරණය කර තිබූ නමුත් 2010 සැප්තැම්බර් 27 දින වන විටත් අපහරණය කර නොතිබූ අතර අපහරණ මණ්ඩලයක් පත්කිරීම හෝ සිදුකර නොතිබුණි. 2010 දෙසැම්බර් වන විට එම වාහනය නිෂ්ක්‍රීය තත්ත්වයේ පවතින බව නිරීක්ෂණය විය.

2.2.5 <u>හඳුනාගත් පාඩු</u>

(අ ) 2007 අගෝස්තු 27 දින පැවැත්වීමට නියමිතව තිබූ "පෙරදිග තරුපෙළ ප්‍රසංගය " නම් කලාකරුවන්ගේ උත්සවය වෙනුවෙන් රු.30,000 ක් ගෙවා බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව වෙන් කර තිබුණත් එම උත්සවය පැවැත්වීමට නොහැකිවී තිබූ අතර නියමිත කාලය තුළ අත්තිකාරම් මුදල් ආපසු අයකර ගැනීමට ක්‍රියා නොකිරීම නිසා එම මුදල් ආයතනයේ වියදම් ලෙස කපා හැරීමට සිදුවී තිබුණි.

(ආ) සේවක භාරකාරත්ව අරමුදල් නියමිත දිනට ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් 2000 වර්ෂයේ සිට 2008 කාලයට අදාළව රු.251,447 ක අධිභාර මුදලක් 2011 මාර්තු මස ගෙවීම් කර තිබුණි.

2.2.6 <u>අයවැය ලේඛනමය පාලනය</u>

(අ ) 2010 වර්ෂය සඳහා සකස් කර තිබූ අයවැය ලේඛනය හා තථ්‍ය ශේෂයන් අතර 31 % සිට 587 % දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස භාවිතා කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) 2010 වර්ෂය තුළ ශබ්දාගාරය කුලියට දීම තුලින් රු.500,000 ක ආදායමක් ඉපයීමට ඇස්තමේන්තු කර තිබුණත් 2010 මාස 08 ක් ගතවන විටත් උපයා ගැනීමට හැකිවී තිබුණේ ඇස්තමේන්තුගත ආදායමින් 16 % ක් වූ රු.80,470 ක් පමණි.

3. <u>පද්ධති හා පාලන</u>

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පදනමේ අධ්‍යක්ෂ ජනරාල් වෙත වරින් වර පෙන්වා දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(i) ක්‍රියාකාර් සැලැස්ම ක්‍රියාත්මක කිරීම
(ii) කාර්ය මණ්ඩල බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි
(iii) මූල්‍ය පාලනය
(iv) අත්තිකාරම් පාලනය
(v ) වාහන පරිහරණය හා ඉන්ධන භාවිතය